# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1734/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 21/11/2024
පැය 0600

## මාධ්‍ය නිවේදනය

**01. දිය අනතුරකින් තරුණයන් තිදෙනෙකු බේරා ගැනීමක් - වැලිගම පොලිස් වසම.**

2024.11.19 වන දින දහවල් කාලයේ වැලිගම පොලිස් වසමේ කප්පරතොට ප්‍රදේශයේ මුහුදු වෙරළේ දිය නාමින් සිටි තරුණයන් තිදෙනෙකු දිය වැලකට හසුව ගසාගෙන යමින් සිටියදී එම ස්ථානයේ ජීවිතාරක්ෂක රාජකාරී යෙදී සිටි පොලිස් කොස්තාපල් 102438 දිසානායක සහ පොලිස් කොස්තාපල් 104360 දේශාන් යන නිලධාරීන් විසින් නිරුපද්‍රිතව බේරා ගෙන ඇත. මොවුන්ට ප්‍රථමාධාර ලබාදී නිවෙස් වෙත පිටත් කර යවා ඇත.

**අනතුරට ලක්වූ තරුණයන් වයස අවුරුදු 18 ක් වන වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**02. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය.**

2024.11.19 වන දින කොළඹ පිහිටි මධ්‍යම තැපැල් හුවමාරුවේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් සහ ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් ඒකාබද්ධව වැටලීමක් සිදුකර ගුවන් තැපැල් මගින් තායිලන්තයේ සිට මෙරටට එවන ලද **කුෂ් කිලෝ 10 ග්‍රෑම් 274 ක් අඩංගු පාර්සල් 02 ක්** රැගෙන යාමට පැමිණි සැකකරුවන් දෙදෙනෙකු සහ ඊට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33, 36 හා 48 වයස්වල පසුවන පාදුක්ක, හෝමාගම හා කළුතර දකුණ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2024.11.20 වන දින අළුයම් කාලයේදී කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 01 ග්‍රෑම් 900 ක්** සන්තකයේ තබාගෙන බැංකොක් සිට මෙරටට පැමිණි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන ඉන්දීය ජාතිකයෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.11.20 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2024.11.20 වන දින සවස් කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ බෝධිරාජ මාවත ප්‍රදේශයේදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 වන බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06.** **ගංජා හේන් 03 ක් වටලා සැකකරුවන් දෙදෙනෙකු සහ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කතරගම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.11.20 වන දින උදෑසන කාලයේ ගෝනගංආර පොලිස් වසමේ යාල රක්ෂිතයේ ගල්ගේ ප්‍රදේශයේදී කතරගම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **අක්කරයක, අක්කර ½ ක සහ පර්චස් 20 පමණ භූමි ප්‍රමාණයකින් යුත් ගංජා හේන් 03 ක් වටලා සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ගෝනගංආර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27 හා 35 වයස්වල පසුවන බෙලිඅත්ත හා ඔක්කම්පිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

2024.11.20 වන දින උදෑසන කාලයේ ගෝනගංආර පොලිස් වසමේ යාල රක්ෂිතයේ ගල්ගේ ප්‍රදේශයේදී කතරගම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ බෝර 12 වර්ගයේ පතරොම් 06 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගෝනගංආර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන ඔක්කම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අඹන්පොල පොලිස් ස්ථානය.**

2024.11.20 වන දින සවස් කාලයේ අඹන්පොල පොලිස් වසමේ හැලබැව ප්‍රදේශයේදී අඹන්පොල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන මහව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. බඹර ප්‍රහාරයක් - නෝර්වුඩ් පොලිස් වසම.**

2024.11.20 වන දින සවස් කාලයේදී නෝර්වුඩ් පොලිස් වසමේ බිලින්බෝනි වත්ත ප්‍රදේශයේදී තේ දළු නෙලමින් සිටි පුද්ගලයෙකු බඹර ප්‍රහාරයකට ලක්ව දික්ඔය රෝහලට ඇතුලත් කර ඇති බවට නෝර්වුඩ් පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 54 ක් වූ බිලින්බෝනි වත්ත, දික්ඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නෝර්වුඩ් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - වැලිඔය පොලිස් වසම.**

2024.11.20 වන දින උදෑසන කාලයේදී වැලිඔය පොලිස් වසමේ සම්පත්නුවර ප්‍රදේශයේදී විදුලි සැර වැදී පුද්ගලයෙකු සම්පත්නුවර රෝහලට ඇතුලත් කර ඇති බවට වැලිඔය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත. තුවාලකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා පදවිය රෝහලටට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ අපොන්සුවත්ත, මයිලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් ඉහත ප්‍රදේශයේ නිවසක නැවතී බේකරි රැකියාවක නිරත වන අතර, විදුලි බුබුලකට අදින ලද විදුලි රැහැනකින් මරණකරුට විදුලි සැර වැදී ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය පදවිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැලිඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - වැල්ලව පොලිස් වසම.

2024.11.20 වන දින දහවල් කාලයේ වැල්ලව පොලිස් වසමේ වැල්ලව හිරිපිටිය මාර්ගයේ බඹරගොඩ ප්‍රදේශයේදී හිරිපිටිය දෙස සිට මුත්තෙට්ටුගල දෙසට ධාවනය වූ කාර් රථයක් ත්‍රීරෝද රථයකට ඉස්සර කිරීමට යාමේදී ඉදිරියෙන් පැමිණි ලොරි රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ලොරි රථ රියදුරු, ලොරි රථ සහායක, කාර් රථයේ රියදුරු සහ කාර් රථයේ ගමන්කළ පුද්ගලයන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා වැල්ලව රෝහලට ඇතුලත් කිරීමේදී කාර් රථයේ ඉදිරිපස අසුනේ ගමන්කළ පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ තල්විට, වැල්ලව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැල්ලව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැල්ලව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - පන්නල පොලිස් වසම.

2024.11.20 වන දින රාත්‍රී කාලයේ පන්නල පොලිස් වසමේ පන්නල දංකොටුව මාර්ගයේ සඳලංකාව ප්‍රදේශයේදී දංකොටුව දෙස සිට පන්නල දෙසට ධාවනය වූ ලොරි රථයක මාර්ගය අයිනේ වැටී සිටි පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පුද්ගලයා සඳලංකාව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් පමණ වන සිංගක්කුලිය, යෝගියාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සඳලංකාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. පන්නල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**